
# සිංහල අක්ෂර මාලාව




© නිර්මාණයේ සම්පූර්ණ අයිතිය ජගත් කුමාර ජයසිංහයන් සතුය නිසි අවසරයකින් තොරව උපුටා ගැනීම තහනම්.

දුරකථන : 0777047391 email : ayannakiyanna@gmail.com

*සැ.යු: කරුණාකර කර්තෘ අයිතිය සුරකින්න. මෙම උපුටා ගැනීමේ දී හෝ පිටපත් මුද්‍රණය කිරීමේදී සදාචාරාත්මක ව කතුවරයාගෙන් නිසි අවසරයක් ලබාගන්නේ නම් මැනවි.*

# සිංහල අක්ෂර මාලාව - කෙටි සටහන

අක්ෂර මාලාව හෙවත් සිංහල වර්ණමාලාව (සිංහල හෝඩිය) පිළිබඳ ව සිදුකර ඇති ඉහත විග්‍රහය මෙතෙක් අක්ෂර මාලා ඉතිහාසයේ අපට හමුවන විද්‍යානුකූලව වර්ණ ගන්වන ලද එකම අක්ෂර මාලාවයි. 2010 වසරේ ''සිංහල සාර සංග්‍රහය'' ග්‍රන්ථයෙහි ද 2015 වසරේ 'අයන්න කියන්න' සිංහල සඟරාවෙහි ද පළ කරන ලද මෙම විග්‍රහය අක්ෂර මාලාව පිළිබඳ ව හදාරන ආධුනිකයෙකුට එක පිටුවක් දෙස බලාගෙන ප්‍රශ්න රැසකට පිළිතුරු දෙමින් අක්ෂර මාලාව පිළිබඳ ව නිසි විග්‍රහයක් කිරීමට හැකිවන මාර්ගෝපදේශයක් ලෙස සකස්කරන ලද්දකි. අක්ෂර මාලාවේ අන්තර්ගතය සම්බන්ධ ව පහත සියලු දෑ එහි අඩංගු වී ඇත.

- **අක්ෂර මාලාවේ ප්‍රභේද**
  1. ස්වර (පණකුරු, ප්‍රාණාක්ෂර) 18
  2. ව්‍යඤ්ජන (හලකුරු, මළකුරු, ගතකුරු, ගාත්‍රාක්ෂර) 42

**01. ස්වරවල ප්‍රභේද**

1. හ්‍රස්ව ස්වර (ලුහු ස්වර, ලඝු ස්වර, කෙටි ස්වර) 08
2. දීර්ඝ ස්වර (ගුරු ස්වර, දික් ස්වර) 10

**02. ව්‍යඤ්ජනවල ප්‍රභේද**

1. වර්ගාක්ෂර
   - අල්පප්‍රාණ (ශිථිලාක්ෂර) 10
   - මහප්‍රාණ (ධනිතාක්ෂර) 10
   - වර්ගාන්තාක්ෂර (අනුනාසික්‍ය - 06) 05
2. සඤ්ඤකාක්ෂර (අර්ධානුනාසික්‍ය අක්ෂර) 05
3. ඌෂ්මාක්ෂර (ඝර්ෂ අක්ෂර) 06
4. අන්තඃස්ථාක්ෂර (අර්ධ ස්වර - 05) 04

- **අකුරු උපදින තැන්**
  1. කණ්ඨජාක්ෂර (උගුරින් උපදින)
     - ස්වර - අ, ආ
     - වර්ගාක්ෂර - ක, ඛ, ග, ඝ, ඞ
     - වෙනත් - ඟ, හ, (අ)ඃ
  2. තාලුජාක්ෂර (තල්ලෙන් උපදින)
     - ස්වර - ඉ, ඊ
     - වර්ගාක්ෂර - ච, ඡ, ජ, ඣ, ඤ
     - වෙනත් - ඦ, ය, ශ

3. මූර්ධජාක්ෂර (මුදුනින් උපදින)

ස්වර - ඍ,ඎ

වර්ගාක්ෂර - ට, ඨ, ඩ, ඪ, ණ

වෙනත් - ඬ, ර, ළ, ෂ

4. දන්තජාක්ෂර (දත් සහ දත්වැටිය ඇසුරෙන් උපදින)

ස්වර - ඏ, ඐ

වර්ගාක්ෂර - ත, ථ, ද, ධ, න

වෙනත් - ඳ, ල, ස

5. ඕෂ්ඨජාක්ෂර (තොල්වලින් උපදින)

ස්වර - උ, ඌ

වර්ගාක්ෂර - ප, ඵ, බ, භ, ම

වෙනත් - ඹ, ව, ෆ

- අක්ෂර මාලාවේ ඝෝෂ අඝෝෂ භේදය

අක්ෂර මාලාවේ ඇතුළත් ස්වර සහ ව්‍යඤ්ජන සියල්ල නැවත ද ඝෝෂ සහ අඝෝෂ වශයෙන් කොටස් දෙකකට බෙදා දක්වා ඇත. එහිදී ඝෝෂයක් යන්න පහත පරිදි අර්ථ කථන කෙරේ.

''පෙනහැල්ලේ'' සිට පැමිණෙන වායුව කණ්ඨයේ දී හෙවත් උගුරේ දී ඝණව පිහිටියා වූ ස්වර තන්තු අතරින් ගමන් කිරීම නිසා නින්නාදයක් හෙවත් කම්පනයක් ඇතිකරන ශබ්ධ ඝෝෂ නම් වේ.

අඝෝෂ යන්න විග්‍රහ කෙරෙන්නේ, ''පෙනහැල්ලේ'' සිට පැමිණෙන වායුව කණ්ඨයේ දී හෙවත් උගුරේ දී ලිහිල් ව පිහිටියා වූ ස්වර තන්තු අතරින් ගමන් කිරීම නිසා නින්නාදයක් හෙවත් කම්පනයක් ඇති නොකරන ශබ්ධ අඝෝෂ නම් වේ.

අක්ෂර මාලාව පිළිබඳ ව මෙහි දක්වා ඇති මුල් රූප සටහනෙහි මෙම සියලු කාරණා ඉතා පැහැදිලිව දැක බලා ගැනීමට හැකි වීම වාසියක් කොට හඟිමු. එසේ ම මෙම සටහන අකාරාදී පිළිවෙළ සකස් කර ගැනීමට ද උපකරණය කි. සිසු දරුවන් ට මෙන් ම ගුරු වරුන්ට ද ඉගෙනුම් ආධාරකයක් ලෙස එකී සටහන භාවිත කිරීමට හැකිවේ.


ඉදිරිපත් කිරීම

ප්‍රවීණ සිංහල දේශක හා ලේඛක,

දෙහිඕවිට අධ්‍යාපන කලාපයේ සිංහල ගුරු උපදේශක,

ගුරුගෙදර රූපවාහිනී සම්පත්දායක,

**ජගත් කුමාර ජයසිංහ**

(බී.ඒ.ගෞරව, සිංහල විශේෂවේදී, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා)